# ශ්‍රී ලංකාවේ තැපැල් ඡන්ද ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහයක් :

## තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීම හා සබැඳි පසුබිම විමසීම හා අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම - 2022

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය **(PAFFREL)**

# ශ්‍රී ලංකාවේ තැපැල් ඡන්ද ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහයක්:

## තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීම හා සබැඳි පසුබිම විමසීම හා අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම - 2022

පැෆ්රල් වෙනුවෙන් එහි ඇරයුමෙන් මෙම පර්යේෂණ පත්‍රිකාව සම්පාදනය කරන ලද්දේ මැතිවරණ හා සබැඳි විෂය ක්ෂේත්‍රයේ පර්යේෂකයෙක් වන මංජුල ගජනායක විසිනි. ඊට වැඩිමනත වශයෙන් මෙහි පළමු කෙටුම්පත සඳහා තම අදහස් සහ යෝජනා ලබාදුන් මැතිවරණ කොමසාරිස් ජෙනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා වෙත ද අපගේ ස්තූතිය පළ කරන්නෙමු.

## ආරම්භය:

සාකල්‍යයෙන් සපිරි මැතිවරණ ක්‍රමයක් පිළිබඳව පවත්නා අභිලාශය 18 වන සියවසේ ආරම්භයට ද ඔබ්බෙන් දිවයන සංකල්පයකි. එහෙත් යථාර්තය වන්නේ පුරවැසි අභිලාශ එලෙසම සමර්පණය කළහැකි මැතිවරණ ක්‍රමයක් නිර්මාණය කිරීම සාතිශය දුෂ්කර වෑයමක් බවයි. ශ්‍රී ලංකාවද ඉතා සුවිශිෂ්ඨ මැතිවරණ වාර්තාවක් සහිත රටක් වුවද අප අනුදත් මැතිවරණ ක්‍රමය පිළිබඳව ඇත්තේ මිශ්‍රිත අදහස් සමුදායකි. එය කෙතරම් විවාදාත්මකද යත් බොහෝ ප්‍රධාන මැතිවරණ ආශ්‍රිත ප්‍රචාරක ව්‍යාපාර තුළ වැඩි අවධානයක් ලත් මැතිවරණ පොරොන්දුවක් වන්නේද පවත්නා මැතිවරණ ක්‍රමය සංශෝධනයට ලක්කිරීම පිළිබඳ කරුණයි.

ඊට වැඩිමනත් ලෙස එලෙස ආණ්ඩුක්‍රම ව්‍යස්ථාමය මැදිහත්වීම් ඔස්සේ ද සමස්ත ක්‍රමයේ වෙනසක් සඳහා ගත් වෑයම්ද මෙරටේ අඩු නැත. ඊට වඩාත් උචිත නිදසුන නම් 14 වන ව්‍යවස්ථා සංශෝධනයයි. එය යම් සාධනීය රාමුවක් මැතිවරණ ක්‍රම සංශෝධනය විෂයෙහි  යෝජනා කර තිබුණද අද ද එකී සංශෝධනය ලේඛනගත ස්වරූපය ඉක්මවන ප්‍රායෝගික භාවිතාවක් සඳහා යොමුකොට නැත. එපමණක් නොව ලොව එකකට එකක් සමාන නොවන ලෙස ක්‍රියාත්මක මැතිවරණ ක්‍රමවේද සමූහයක් දිස්වන අතර එකී මැතිවරණ ක්‍රියාවලීන් දරාගන්නා මෙවලම් වන්නේ එක් එක් ක්‍රමවේදය තුළ දක්නට ඇති පාරිපාටිගත මෙන්ම නෛතික  භාවිතාවන්ය. එහිලා වඩාත් අවධානයට ලක්වන හා තීරණාත්මක සාධකය වන්නේ ඡන්දය ප්‍රකාශ කිරීමයි. ලොව කවර මැතිවරණ ක්‍රමයක වුව වෙසෙස් අවධානයක් හා තියුණු සැළසුම්සහගත බවක් අවැසි එක් ක්ෂේත්‍රයක් වන්නේද ඡන්ද භාවිතාව හා සබැඳි ක්‍රියාපරිපාටියේ සුහුරු නිමැවුමයි.

එහිලා මෙරටේ ඡන්ද ක්‍රමය මුළුමනින්ම නිමැවී ඇත්තේ සම්ප්‍රදායිකව හඳුන්වා දී ඇති සාමාන්‍ය ක්‍රමවේදයක් ඔස්සේ වන අතර එහි සමහර අංග ක්‍රමයෙන් ඩිජිටල්කරණය වෙමින් පවතින බවක්ද දිස්වේ. ඡන්දය ප්‍රකාශ කිරීම නම් වූ අවස්ථාව විමසීමේදී පැහැදිළි වන්නේ එය සපුරා සාමාන්‍ය ක්‍රමවේදය යටතේ ක්‍රියාවට නැඟුන බවයි. ඊට අදාළ නීතිය මෙරටේ ක්‍රමිකව සංවර්ධනය වී ඇත්තේය. එහිලා වඩාත් විධිමත් විවරණයක්  සඳහන්ව ඇති 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ අන්තරගතය විමසීමේදී පැහැදිලි වන එක් කරුණක් ඇත. එනම් එදාමෙදා තුර මීට අදාළ නීතිය එතරම් සැළකිය යුතු මට්ටමේ වෙනසකට ලක්ව නැති බවයි. ඊට අමතර වශයෙන් නව ලෝක ප්‍රවණතා ද මැතිවරණ පරිපාටීන් කෙරෙහි දැඩිව බලපා ඇත්තේය. ඊට ආසන්නතම සිද්ධි සමුදාය වන්නේ කොවිඩ් 19 ලෙස ලොවම විපතේ දැමූ ව්‍යසනයයි. එය යටත් පිරිසෙන් දෙවසරකට වැඩි කලක් ලොවම පීඩනයට ලක්කළ අතර මිනිස් ජීවිත වලට අමතරව වැඩිම බලපෑමක් සිදුවූයේ ඒ ඒ රාජ්‍යයන්හි සාමාන්‍ය පැවැත්ම කෙරෙහිය. මැතිවරණ එහිලා ප්‍රමුඛය. නිදසුනක් ලෙස ලොව රාජ්‍ය 60 කට ආසන්න ප්‍රමාණයක් ව්‍යවස්ථාපිතව පැවැත්විය යුතුව තිබූ මැතිවරණ පැවැත්වීම කල් දැමූ අතර එසේත් නැත්නම් සම්ප්‍රදායික ක්‍රමවේද පිළිබඳ නවමු ප්‍රවේශයකින් කටයුතු කිරීම අරඹනු ලැබීය.

ඊට අදාළ නිදසුන් කිහිපයක් පිළිබඳව විමසා බැලිය හැකිය.  ඉන් එකක් වන්නේ මෙරටේ වසර 2020 පැවති පාර්ලිමේන්තු මැතිවරණයයි. සාමාන්‍ය වශයෙන් මැතිවරණ නිවේදනය ජනගත කොට දින 75 ක උපරිම කාල සීමාවක් ඇතුළත පවත්වා අවසන් කළයුතු එකී මැතිවරණයෙහි ප්‍රචාරක කාල සීමාව දින 156 ක් වීමයි. එහි ප්‍රතිපක්ෂගත ප්‍රවණතාවක් දිස්වූයේ වසර 2010 මාර්තු මස 22 වැනිදින පැවති දකුණු කොරියානු ව්‍යවස්ථාදායකය සඳහා සාමාජිකයන් තෝරාගැනීම වෙනුවෙන් පැවති ජාතික මැතිවරණයේදීය. එය පළමු වරට කල් දැමුවද දෙවැනිවර පවත්වනු ලැබූයේ අවැසි සියළු සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද නිසිපරිදි යොදාගැනීමෙන් අනතුරුවයි. එපමණක් නොව එහිලා දක්නට ලැබුණු වෙසෙස් කරුණක්ද වීය. එනම් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පෙළඹුණු සියළු සුදුසුකම්

PUSHPA PUSHPANANDA EKANAYAKA 1998

ලත් ඡන්දහිමියන් සඳහා වඩාත් සරල මෙන්ම ආරක්ෂාකාරී අවස්ථාවක් උදාකිරීම උදෙසා පූර්ව ඡන්ද භාවිතා කිරීමට උනන්දු කරවීමයි.

එකී උත්සහය බොහෝසෙයින් එලදැරූ අතර මැතිවරණය අවසානයේදී එලෙස මැතිවරණ දිනයට ප්‍රථම තම ඡන්දය භාවිත කරනලද ඡන්දහිමි ප්‍රජාවේ ප්‍රතිශතය 26.8 ක් විය. එහිලා අවධානයට ලක්කළ යුතු එක් ප්‍රධාන කරුණක් ඇත. එනම් එරටේ එවැනි ප්‍රවණතාවක් සඳහා ඡන්දහිමියන් පෙළගැස්වීමට හැකිවූයේ අදාළ නීතිරීති ඒ වනවිටත් නිසිපරිදි සකස්ව පැවති නිසාය. ඒ කෙසේවතුදු මෙහිලා වැදගත්ම කරුණ නම් එවැනි අනපේක්ෂිත විපත්තිකර අවස්ථාවකදී වුව මැතිවරණයක් නිසි ක්‍රියාපරිපාටින් අනුගමනය කොට පැවැත්වීමේ සම්භාවිතාව විමසීම සඳහා ලොව මැතිවරණ කළමනාකරණ ආයතන වැඩිවැඩියෙන් උනන්දු වෙමින් සිටින බවයි. එවැනි පසුබිමක ශ්‍රී ලංකාවේ තැපැල් ඡන්ද ක්‍රියාවලිය පිළිබඳව විමසීම කාලින මෙන්ම අනාගතවාදී ද වේ.

## ඡන්දය ප්‍රකාශ කිරීමේ විධික්‍රම:

මැතිවරණයක් යනු ඉතා දැවැන්ත ප්‍රවර්තන මෙහෙයුමකි. එලෙස දැවැන්ත හා තීරණාත්මක දිනක් උදෙසා වෙසෙස් ක්‍රියාමාර්ග සමුදායක් ගනු ලබන්නේ ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය වඩාත් ජනතාකරණය කිරීමේ අරමුණිනි. එහිදී සැළකිල්ලට බඳුන් කරන එක් ප්‍රධාන කරුණක් වන්නේ සියළු ඡන්දහිමියන් හට සමාන අවස්ථා හිමිවේද යන්න හා කිසිවෙකු අගතියට පත් නොවිය යුතු යන කරුණයි. තවද එලෙස උපයෝගී කරගන්නා කිසිදු ක්‍රමවේදයක් මානව හිමිකම් උල්ලංඝනය නොවන මෙන්ම ප්‍රජාතන්ත්‍රිය වටිනාකම් ආරක්ෂා වන එකක් විය යුතුය. එහිලා වැදගත් තවත් කරුණක් වන්නේ පුරවැසි විශ්වාසය දිනාගන්නා ක්‍රමවේදයක් පැවතීමයි. එහෙත් ඒ එකද ක්‍රමයක් හෝ එලදායි නොවිය හැකි සාධකයක්ද බලවත්ව පවතී. ඒ ඡන්දය ප්‍රකාශ කිරීමේ විධික්‍රමයේ ඇති සංකීර්ණත්වයයි. එහෙයින් ඒ කවර ක්‍රමයක් වුවද සාතිශය සරල විය යුතුය යන කරුණ අවිවාදිතය

ලොව පවත්නා ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමවේද සළකා බැලීමේදී එකී ක්‍රමවේද මූලික වශයෙන් දෙයාකාර බව පැහැදිළිය. එනම් Absentee Voting or Voting by Mail Early Voting ලෙසිණි මෙකී ක්‍රමවේද දෙක අතර සැළකිය යුතු මට්ටමේ බරපතල වෙනසක්ද දිස්නොවේ.

## Absentee Voting (මැතිවරණ දිනයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අසමත් ඡන්දහිමියන්) :

මෙමඟින් අවස්ථාව සළසා ඇත්තේ මැතිවරණ දිනයේදී හදිසි තත්වයක් හේතුවෙන් තම ඡන්දය භාවිත කිරීමට අවස්ථාව අහිමි ඡන්දහිමියන් සඳහා තම ඡන්දය භාවිත කිරීමටය. බොහෝවිට තැපැල් මඟින් හෝ ඡන්ද භාවිතය උදෙසා විශේෂයෙන් සැකසූ එසේත් නැත්නම් නම් කරන ලද යම් ඇටවුමක්/පෙට්ටියක් තුළට සළකුණු කරන ලද නිල ඡන්ද පත්‍රිකාව බහාලීමට අවස්ථාව උදාවේ. බොහෝවිට මෙකී පහසුකම ලබන පාර්ශව වන්නේ හදිසියේ රෝගාබාධ වලට ලක්වන පිරිස් මෙන්ම ශිෂ්‍යයන් ආදී පිරිස්ය. ඊට අදාළ නීතිරීති සහ ක්‍රියාපරිපාටීන් බොහෝදුරට එකසමාන නොවේ. මෙකී ක්‍රමවේද බහුල වශයෙන් උපයෝගී කරගනු ලබන්නේ ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු රටවල් කිහිපයක්ය. එහිදීද සැළකිය යුතු කරුණ වන්නේ ඒ ඒ ප්‍රාන්ත අතර පවත්නා පරිපාටීන් එකිනෙකට වෙනස් බවයි.

## Early Voting පූර්ව ඡන්ද භාවිතයඃ

මෙය Advance Voting ලෙසද හැඳින්වේ. මෙහි විශේෂත්වය වන්නේ පූර්ව ඡන්ද භාවිතය සඳහා සුවිශේෂී වශයෙන් වෙන්කරන ලද කාල පරාසය තුළ තම ඡන්දය ප්‍රකාශ කිරීමයි. ආබාධ සහිත පුද්ගල ප්‍රජාව මෙන්ම වෙනත් ආගමික විශ්වාස හෝ තවත් විශේෂ කරුණු හේතුවෙන් ඡන්දපොළට පිවිසීමට අසමත් ඡන්දහිමියන් මෙහිදී අවධානයට ලක්වේ.

මෙකී ක්‍රම දෙක පිළිබඳව වඩාත් සරල අවබෝධය පිණිස එකී ක්‍රම දෙක පිළිබඳව ම විමසා අන්තර්ගත කරුණු කිහිපයක් පහත දැක්වේ.

| තාවකාලික හේතූන් මත මැතිවරණ දින පැමිණීමට අපහසු පිරිසේ ඡන්ද භාවිතය | පූර්ව හෙවත් සාර්වත්‍රික ඡන්ද භාවිතය |
|---|---|
| ඡන්දය පැවැත්වෙන සාමාන්‍ය කාල සීමාවන් තුළ අදාළ නගරයේ රැඳී නොසිටීම හෝ යම් ශාරීරික ආබාධයක් /ආගමික විශ්වාසයක් මත ඡන්ද භාවිතය සඳහා පැමිණීමට අපහසුතා ඇති පිරිස් | මැසචුසෙට්ස්හි සියළු ලියාපදිංචි ඡන්දදායකයන් තම ඡන්දය ප්‍රකාශ කල යුත්තේ ඔබ ලියාපදිංචි වූ නගරයේදීය<br><br>පෞද්ගලිකව ඡන්ද ප්‍රකාශ කරන විටෙකදී අයදුම්පතක් අවශ්‍ය නොවේ |
| එකම ගෘහයේ වාසය කරන සාමාජිකයෙක් හට ලියාපදිංචි ඡන්දහිමියෙක් වෙනුවෙන් මැතිවරණ දින පැමිණීමට නොහැකි තැනැත්තන් සඳහා පිරිනමන ඡන්ද හිමිකම ලබාගැනීම සඳහා ඉල්ලීමක් කල හැකිය<br><br>මැතිවරණ දින පැමිණීමට නොහැකි තැනැත්තන් සඳහා පිරිනමන ඡන්ද හිමිකම හැමවිටම ලබාදෙනු ලබන්නේ අදාළ තැනැත්තාගේ ඉල්ලීමක් මතය. එවැන්නක් සඳහා අයදුම්පතක් හෝ ලිපියක් මඟින් ඉල්ලීමක් කල හැකිය<br>යම් ඉල්ලීමක් ලද විගස ඡන්ද පත්‍රිකා තැපෑලට යොමුකරනු ඇත | පූර්ව ඡන්ද පත්‍රිකාවක් තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් කල හැක්කේ ඡන්දදායකයාට පමණි<br><br>පූර්ව ඡන්ද අයදුම්පත් භාරදීම පූර්ව ඡන්ද සඳහා වන කාල සීමාවට මෙපිටින් සිදුකල යුතුය<br><br>ඔබගේ පූර්ව ඡන්ද භාවිතය සඳහා ඔබම ඉල්ලීම කිරීමට කාරුණික වන්න<br>පූර්ව ඡන්ද කාලසීමාව ආරම්භ වීමෙන් අනතුරුව ඡන්ද පත්‍රිකා තැපෑලට යොමුකරනු ලැබේ. |
| නගරයෙන් නික්මීමට ප්‍රථම කාර්යාලය තුළදී තම ඡන්දය භාවිත කල හැකිය | අදාළ කාල සීමාව තුළ ඡන්දය භාවිත කිරීමට හැකිය |

## තැපැල් ඡන්ද - ශ්‍රී ලාංකේය සංදර්භය

### අනාදිමත් කලෙක පටන් භාවිත ශ්‍රී ලංකාවේ තැපැල් ඡන්ද ක්‍රියාවලිය

ශ්‍රී ලංකාවේ තැපැල් ඡන්ද ක්‍රියාවලියේ සමාරම්භය සිදුවන්නේ වෙනත් බොහෝ රටවල ක්‍රියාත්මක වුවා සේ මැතිවරණ ක්‍රියාවලිය තුළ අවශ්‍යයෙන්ම අවම නියෝජනයක් සහිත පිරිස වෙත ඡන්ද ප්‍රකාශ කිරීමේ පහසුකම ලබාදීම සඳහා නොවේ. එහි පසුබිම වන්නේ මැතිවරණ රාජකාරියෙහි නිරත යම් පිරිසක් වෙත තම ඡන්ද ප්‍රකාශ කිරීමේ හිමිකම ලබාදීමයි. මැතිවරණයක් යනු පාර්ශව ගණනාවක වෙසෙස් සම්මිශ්‍රණයකින් සමන්විත දැවැන්ත මානව ක්‍රියාකාරකමකි. එහිදී පෙරමුණ ගන්නා මැතිවරණ සහ අනෙකුත් අරක්ෂක අංශ නිළධරයන් මෙකී හිමිකම ලබන පිරිසයි. ඒ මෙරටේ පැවැත්වෙන සෑම මට්ටමකම මැතිවරණ සඳහාය. පොදුවේ සැළකිය හැක්කේ තෙයාකාරයක පිරිසක් මෙම හිමිකම ලබන බවයි. එනම් මැතිවරණ රාජකාරි පැවරීමට ඉඩ ඇතැයි සලකන රාජ්‍ය නිලධාරීන්, අත්‍යවශය සේවාවන්හි සේවයේ නියුතු නිලධාරීන්, සේවකයින් මෙන්ම ත්‍රිවිධ හමුදා, පොලිස් සහ සිවිල් ආරක්ෂක බලකාය යටතේ දිවයිනේ සියලුම ප්‍රදේශවල ආරක්ෂක කටයුතු වල නිරත පුද්ගලයින් ආදී ලෙසිණි.

ඒ අනුව තැපැල් ඡන්ද හා සබැඳි මැතිවරණ නීතිය සඳහන් හා තැපැල් ඡන්ද භාවිතය දිසි මැතිවරණ වර්ග පහක් පමණ මෙරටේ මැතිවරණ නීතිය තුළ අන්තර්ගතය. ඒ මෙපරිදිය.

- 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත
- 1981 අංක 07 දරන ජනමත විචාරන පනත
- 1981 අංක 15 දරන ජනාධිපති තෝරා ගැනීමේ පනත
- 1987 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත
- පළාත් පාලන ඡන්ද විමසීම් අඟ පනත (262 වන අධිකාරය)

එහිලා මෙම හිමිකම ලබන තැනැත්තන් කවුරුන්ද යන වගද 1981 නිර්මිත අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා ගැනීමේ පනතේ සඳහන්ය.

i. ශ්‍රී ලංකා යුධ හමුදා සාමාජිකයෙකු
ii. ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයෙකු
iii. ශ්‍රී ලංකා ගුහෝ න් හමුදාවේ සාමාජිකයෙකු
iv. ශ්‍රී ලංකා පොලීසියේ නිළධරයෙකු හෝ සේවකයෙකු
v. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිළධරයෙකු හෝ සේවකයෙකු
vi. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිළධරයෙකු හෝ සේවකයෙකු
vii. තැපැල් දෙපර්තෙමේන්තුවේ නිළධරයෙකු හෝ සේවකයෙකු
viii. විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ නිළධරයෙකු හෝ සේවකයෙකු
ix. ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ නිළධරයෙකු හෝ සේවකයෙකු
x. ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක නිළධරයෙකු හෝ සේවකයෙකු

xi. තම සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතුකොටගෙන පෞද්ගලිකව තමාට වෙන්කරන ලද ඡන්ද පොළේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකිවීම හෝ නොහැකිවීමට ඉඩ තිබීමේ හේතුව මත

xii. රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහබැංකුවේ හෝ ශ්‍රී ලංකා පළාත් පාලන සේවයේ වෙනත් යම් නිළධරයෙකු හෝ සේවකයෙකු ඡන්ද විමසීම් පැවැත්වෙන දිනයේ තෝරාගැනීම් කටයුතු සඳහා සේවයේ නියුක්ත කිරීමට ඉඩ තිබීමේ හේතුව මත

xiii. තම අපේක්ෂකත්වය නිසා වෙන්කරන ලද ඡන්ද පොළෙන් ඡන්දය දීමට නොහැකිවීමේ හේතුව මත අපේක්ෂකයෙකුට (වගන්තිය (23/(2) වගන්තිය

ඉහත සඳහන් කවර හෝ සේවාවක නිරත රජයේ සේවකයෙක් වේවා තැපැල් ඡන්ද සඳහා අයදුම් කිරීමේ හිමිකම නිරායාසයෙන් හිමිවන්නේය. යම් අවස්ථාවකදී අදාළ මැතිවරණයක රාජකාරියක් සඳහා වාර්තා නොකරන්නේ නම් ඔවුන්ට පෞද්ගලිකව ඡන්ද පොළට ගොස් තම ඡන්දය භාවිත කිරීමේ හැකියාවද ඇත්තේය. ඒ කෙසේවතුදු කවර හෝ මැතිවරණයක් ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව දින හයක් ඇතුළත තම අවැසියාව සහතික කිරීමේ නිළධරයා මඟින් අදාළ තේරීම් භාර නිළධරයා වෙත දැන්වීම නෛතිකව දක්වා ඇති ක්‍රමවේදයයි. මෙහිලා වඩාත් සැළකිලිමත් වියයුතු අනෙක් කරුණ වන්නේ තැපැල් ඡන්ද ඉල්ලුම් කරන ලද හෝ තැපැල් ඡන්ද භාවිත කරන ලද්දෙක් වෙනත් ඡන්ද පොළක තම ඡන්දය භාවිත කරන්නේ නම් එය සිරදඬුවම් ලැබිය හැකි වරදක් වන බවයි.

තැපැල් ඡන්ද හිමිකම පිළිබඳව සළකා බලන කල පැහැදිළි කරුණක් වන්නේ එය සමස්ත ඡන්දහිමි සංඛ්‍යාවෙන් ඉතා අවම ප්‍රමාණයක් බවයි. ඒ මෙපරිදිය.

- අවසන් වරට පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ලියාපදිංචි සමස්ත ඡන්දහිමියන් සංඛ්‍යාව 2020 - 16,436,056
- තැපැල් ඡන්දය උදෙසා ලැබුණු සමස්ත අයදුම්පත් සංඛ්‍යාව - 756,594
- අනුමත අයදුම්පත් සංඛ්‍යාව - 705,505
- ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛ්‍යාව - 51,089

මේ අනුව අවසන් වශයෙන් සළකා බැලිය යුතු වන්නේ අනුමත අයදුම්පත් සංඛ්‍යාව බැවින් එකී ප්‍රමාණය සමතයක් වශයෙන් මුළු ඡන්දහිමියන් ප්‍රමාණයෙන් 7.42% කි.

මෙරටේ වැඩිම තැපැල් ඡන්ද අයදුම්කරුවන් සංඛ්‍යාවක් වාසය කරන පරිපාලන දිස්ත්‍රික්කය වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයයි. සංඛ්‍යාත්මකව එය 74,565 ක් පමණ වේ. අනතුරුව නුරාධපුර (56,458) ගම්පහ (54,098), මහනුවර (54052), යන දිස්ත්‍රික්ක පෙරට පැමිණේ. ඊට ප්‍රතිපක්ෂව මුලතිව් දිස්ත්‍රික්කය අවම අයදුම්පත් ප්‍රමාණයක් සහිත ප්‍රදේශය වන අතර එහි සංඛ්‍යාත්මක අගය 3,381 කි. (Ref. 2020 අගෝස්තු මස 05 වන දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාවේ වාර්තාව ඇසුරෙණි)

තැපැල් ඡන්දදායකයෙකු ලෙසින් සපුරාලිය යුතු සුදුසුකම් පිළිබඳව පවත්නා නෛතික රාමුව ඉතා පැහැදිළිය. එහි ඉලක්කය මැතිවරණ දිනයේ ප්‍රවර්තන කාර්යය සඳහා එළඹෙන පිරිස සඳහා විකල්ප අවස්ථාවක් සැළසීමයි. එසේ හෙයින් එය ස්ර්ජුවම පූර්ව ඡන්ද ක්‍රමයක්ද නොඑසේනම් වෙනත් ආකාරයේ විධික්‍රමයක් ද යන්න පිළිබඳව ද ඇත්තේ යම් සංශයකි. ඒ අනුව මෙය අදාළ තැනැත්තා පෞද්ගලිකවම තම සහභාගිත්වය දැක්විය යුතු දුරස්ථ ඡන්ද භාවිතයකි. එබැවින් මෙය නිසැකවම දෙමුහුන් (Hybrid) ක්‍රමයක් ලෙස වටහා ගැනීම වැදගත්ය. එහිලා පවත්නා වාසිදායක තත්වය වන්නේ ඡන්දදායකයා හට කිසිදු බලපෑමකට යටත් නොවී තම ඡන්දය භාවිත කිරීම සඳහා ලැබෙන අවස්ථාවයි. තේරීම්භාර නිළධරයා විසින් නම් කරන ලද සහතික කිරීමේ නිළධරයෙක් අභියස පූර්වයෙන් නම්කරන ලද තැපැල් ඡන්ද මධ්‍යස්ථානයකදී ඡන්දය ප්‍රකාශ කිරීම සාපේක්ෂව අවම

බාධාකිරීමකට ලක්විය හැකි අවස්ථාවකි. මෙරටේ තැපැල් ඡන්ද ක්‍රියාවලිය උදෙසා අනුදත් ක්‍රියාමාර්ග සමුදායද වැඩි සුරක්ෂිතතාවක් ඇති එකකි.

එහි සමස්ත ක්‍රියාවලිය දැඩි පාලනයකට යටත් වේ. අදාළ අයදුම්පත්‍රය සහතික කරන ලද එකක් වන අතර තමන් හට අදාළ රාජ්‍ය ආයතනය වෙත ලැබෙනුයේ රක්ෂිත තැපෑල මඟිනි. එය බොහෝදුරට අයදුම්කරුවන් සියලුදෙනාට එකවර ලැබෙන සේ යොමුකරන්නකි. ඊට අමතර වශයෙන් ඡන්ද ගණන් කිරීමේ ක්‍රියාවලිය තුළ ද මීට ලැබී ඇත්තේ ඉහළ ප්‍රමුඛතාවකි. ඡන්ද ගණනයේදී ආරම්භයේදීම තැපැල් ඡන්ද ගණනය සිදුකරන අතර එය නිරීක්ෂණය සඳහාද දේශපාලන පක්ෂ/අපේක්ෂකයන් සඳහා අවකාශ සළසා ඇත. තැපැල් ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කිරීමද මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයේ එක්  වැදගත් පියවරකි. පොදුවේ ශ්‍රී ලාංකේය ඡන්දදායකයන් අතර මුල්බැසගත් මතයක් වන්නේ තැපැල් ඡන්ද ප්‍රතිඵල ඔස්සේ ඉහළින් සිටින කණ්ඩායම/පක්ෂය ජයගන්නා බවයි. එය සංඛ්‍යා විද්‍යාත්මකව කිසිදු සමීක්ෂණයකට භාජනය කෙරුණු අදහසක් නොවේ. එනමුත් ඉන් තැපැල් ඡන්දයේ පවත්නා අගය පිළිබඳව යම් හෝඩුවාවක් නිසැකවම ලැබේ.

එපමණක් නොව මෙහිලා සැළකිය යුතු අනෙක් කරුණ නම් ශ්‍රී ලංකාවේ අනුදත් තැපැල් ඡන්ද ක්‍රියාවලිය ලොව පවත්නා ඡන්ද දිනට නිසැකවම පැමිණීමට නොහැකි පිරිස් අමතන ආකාරයේ (Absentee Voting Process) එකක්ද නොවේ. ලොව පවත්නා තැපැල් ඡන්ද ක්‍රමවේද පිළිබඳව සළකා බැලීමේදී නිරීක්ෂණය වන්නේ බොහෝ අවස්ථාවලදී පෞද්ගලික ලිපිනයට ගෙන්වා ගන්නා අයදුම්පත්‍රයක් මඟින් පෞද්ගලිකවම තැපෑල ඔස්සේ තම ඡන්දය භාවිත කිරීමට සුදුසු පුද්ගලයන් හට අවස්ථාව හිමිවන බවයි.

තවද කාල සීමාව ද මෙහිලා ඉතා වැදගත්ය. අයදුම්කිරීම සඳහා කෙටිකාල සීමාවක් දීම සාමාන්‍ය ක්‍රමවේදය වුවත් එකී කෙටිකාල සීමාව තුළ අදාළ ආරක්ෂණ ක්‍රමවේද ද අනුගමනය කරමින්, නිශ්චිත දැනුම්වත්කිරීමක් සමඟ ක්‍රියාවලිය සමාප්ත කිරීම යම් අභියෝගාත්මක කර්තව්‍යයකි. නිදසුනක් ලෙස මෙරටේ පාර්ලිමේන්තු සහ ජනාධිපතිවරණයකදී අයදුම්කිරීම සඳහා ලැබෙන කාලය දින 07 සිට  10 දක්වා වූ කාල පරාසයකි. සාමාන්‍යයෙන්  පූරව ඡන්ද භාවිතයේදී ලොව බොහෝ රටවල් දින 15 දක්වා කාල සීමාවක් ලබාදීම සාමාන්‍යයෙන් සිදුවේ.

## ව්‍යසන සමයක තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම

මෙරටේ අවසන් වරට පැවති පාර්ලිමේන්තු මැතිවරණය නිසැකවම ඉතා ඉහළ අවදානමක් සහිතව පවත්වන ලද අභියෝගාත්මක මැතිවරණයකි. කොවිඩ් 19 මඟින් බලපෑමට ලක්වූ මැතිවරණ ප්‍රචාරක සමය බොහෝදෙනාගේ දැඩි අවධානයටද ලක්වූවක් විය. ඊට සමගාමීව තැපැල් ඡන්ද ක්‍රියාවලියද අවධානයට ලක්වීම සාමාන්‍ය කරුණකි. පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී තැපැල් ඡන්ද සඳහා අයදුම්පත් කඳවු කාල වකවානුව වූයේ 2020 මාර්තු මස 06 වැනිදින සිට එම මස ම 16 වැනිදින මධ්‍යම රාත්‍රී 12 දක්වා වූ කාල පරාසයයි. එහෙත් කොවිඩ් 19 හදිසි පැතිරීම ඊටද බාධා පැමිණවූ බැවින් කාල පරාසය දිගුකිරීමක් සිදුකරනු ලැබීය. දෙවරකදී පමණ එලෙස කාල පරාසය නැවත නැවතත් දිගුකරනු ලැබුවේ රටෙහි ස්ථාපිත සංචරණ සීමා මෙන්ම නිවාඩු දින ප්‍රකාශ කිරීම ආදිය සැළකිල්ලට ගැනීම් හේග0තුවෙනි. එහිලා සිදුකල වඩාත්ම සුබවාදී මෙන්ම හිතකර කාර්යයක්ද විය. එනම් පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26(2) ආ වගන්තිය උපයෝගී කරගනිමින් සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා තැපැල් ඡන්ද පහසුකම ලබාදීමයි. එය මෙරටේ මැතිවරණ ඉතිහාසයේ සිදුවූ දුර්ලභ සිදුවීමකි. එනම් මැතිවරණ පනත්හි නිශ්චිතව නම් කරන ලද පිරිස්වලට පිටින් යම් පිරිසක් හඳුනා ගැනීම හා තැපැල් ඡන්ද බලය ලබාදීමයි.


[1]

[1] https://runews.lk/news/item/8248-official-postal-votes-to-post-offices

**තැපැල් ඡන්දදායකයෙකු ලෙස සලකනු ලැබීම සඳහා කරන ලද ඉල්ලීමක් පිළිනොගන්නා අවස්ථා:**

මෙරටේ මැතිවරණ ක්‍රියාවලිය තුළ ඡන්ද ප්‍රතික්ෂේප වීම යන්න අරුමැසි යමක් නොවේ. ලෝක සංදර්භයෙන් ගත්කල බොහෝවිට දක්නට ඇත්තේ මෙහි ප්‍රතිපක්ෂයයි. එනම් අවම ඡන්ද ප්‍රකාශ කිරීමේ භාවිතාවක් හා අවම නරක් වූ ඡන්ද ප්‍රතිශතයක්ය. එහෙත් මෙරටේ ඡන්ද භාවිතය ඉතා ඉහළ මට්ටමක පවතින අතර එය වසර 1947 පැවති පලමු පාර්ලිමේන්තු මැතිවරණයේදී පටන්ම දක්නට ලැබුණකි. එය වඩාත් තහවුරු කිරීම සඳහා පහත වගුව පරිශීලනය කල හැකිය.

ඊට අදාළව ම මෙම පර්යේෂණ පත්‍රිකාව තුළ වැඩිමනත් අවධානයට ලක්කොට ඇති අනෙක් කරුණ වන්නේ අයදුම්පත් ප්‍රතික්ෂේප වීමේ කරුණයි. මෙරටේ එදාමෙදාතුර පැවති සෑම ඡන්දයකදීම පාහේ මෙලෙස අයදුම්පත් ප්‍රතික්ෂේප වීම සිදුව ඇති අතර පසුගිය දශකයක කාල සීමාවේ එලෙස ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශත පහත දැක්වේ.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මැතිවරණ ඉතිහාසය 1947 - 2020**

| මැතිවරණය | ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව | ප්‍රකාශිත මුළු ඡන්ද සංඛ්‍යාව | ප්‍රකාශිත ඡන්ද ප්‍රතිශතය | ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| *තනි පුද්ගල බහුතර කේවල කොට්ඨාශ ක්‍රමය යටතේ* | | | | | |
| 1947 | 3,048,145 | 1,710,150 | 56.10% | 44,570 | 2.61% |
| 1952 | 2,990,912 | 2,114,615 | 70.70% | 37,552 | 1.78% |
| 1956 | 3,464,159 | 2,391,538 | 69.04% | 30,683 | 1.28% |
| 1960 (March) | 3,724,507 | 3,041,420 | 81.66% | 32,040 | 1.05% |
| 1960 (July) | 3,724,507 | 3,076,869 | 82.61% | 22,225 | 0.72% |
| 1965 | 4710887 | 3,821,918 | 81.13% | 33,234 | 0.87% |
| 1970 | 5,505,028 | 4,991,798 | 90.68% | 25,828 | 0.52% |
| 1977 | 6,667,589 | 6,243,573 | 93.64% | 32,989 | 0.53% |
| *සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ* | | | | | |
| 1989 | 9,374,164 | 5962031 | 63.60% | 365,563 | 6.13% |
| 1994 | 10,945,065 | 8,344,095 | 76.24% | 400,389 | 4.80% |
| 2000 | 12,071,062 | 9,128,823 | 75.63% | 481,155 | 5.27% |
| 2001 | 12,428,762 | 9,449,813 | 76.03% | 493,944 | 5.23% |
| 2004 | 12,899,139 | 9,797,680 | 75.96% | 534,948 | 5.46% |
| 2010 | 14,088,500 | 8,630,689 | 61.26% | 596,972 | 6.92% |
| 2015 | 15,044,490 | 11,684,098 | 77.66% | 517,123 | 4.43% |
| 2020 | 16,263,885 | 12,343,392 | 75.89% | 744,373 | 6.03% |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව*

## තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම

තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම විවිධ හේතු රාශියක් ඔස්සේ සිදුවිය හැකිය. එය මූලික වශයෙන්ම නෛතික සීමාවේ හා පරිපාටිගත කරුණු යටතේ සිදුවන අතර සාමාන්‍ය ඡන්දයක් ප්‍රතික්ෂේප කිරීමේ කරුණට වඩා වැඩි අවධානයක් මීට යොමුවීමට හේතුවන කරුණු කිහිපයක් පවතී. ඒවා මෙලෙස සටහන් කල හැකිය.

තැපැල් ඡන්ද අයදුම්කිරීම මුළුමනින්ම රජයේ නිළධාරීන්/සේවකයන් මඟින් සිදුකරන්නක් බැවින් ඉහළ පරිසාධනයක් අපේක්ෂා කෙරේ. අයදුම්කිරීමේදී වැරදීමට ඇති ඉඩ අවමය. හේතුව පෞද්ගලිකව එය සිදුකිරීමට අවකාශ ඇති බැවිනි. තවද තවත් ආසන්නතම ඉහළ නිළධාරියෙකුගේ අවධානයට ලක්වේ.

එක් තැපැල් ඡන්දයක් සඳහා සාපේක්ෂව වැයකිරීමට සිදුවන මුදල සාපේක්ෂව අධිකය. දළ වශයෙන් ඒ සඳහා වැයවියහැකි මුදල මෙලෙස දැක්විය හැකිය. තවද මේ සඳහා මැතිවරණ කොමිෂන් සභාවෙන් පරිබාහිර ආයතනයක් ද සහයට කැඳවා ගත යුතුය. මීළඟ මැතිවරණයක් සඳහාද වයවියහැකි මුදල සාපේක්ෂව දෙගුණ වීමේ සම්භාවිතාවක් පවතී. රටෙහි පවත්නා උද්ධමනය සහ අනෙකුත් සෑම ආයතනයකම දක්නට ඇති අසාමාන්‍ය නඩත්තු පිරිවැය මීට බලපාන හේතුවයි.

පොදුවේ අයදුම්පත් ප්‍රතික්ෂේප වන්නේ පහත සඳහන් අවස්ථාවලදීය

- අයදුම්පතෙහි පරිපාලන දිස්ත්‍රික්කය වැරදි ලෙස සඳහන් කර ඇති විට,
- තැපැල් ඡන්ද ඉල්ලීමේ හිමිකමක් නොමැති අවස්ථාවක,
- අයදුම්පතේ සඳහන් තොරතුරු ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි තොරතුරු හා නොගැලපෙන විට,
- නමට ඇති අනුක්‍රමික අංකය අයදුම්පතේ නිවැරදිව සඳහන් කර නොමැති විට,
- ඉල්ලුම්කරු ඉල්ලුම්පත අත්සන් කර නොමැති අවස්ථාවක,
- සහතික කිරීමේ නිලධාරී අයදුම්පත සහතික කර නොමැති අවස්ථාවක,
- තේරීම්භාර නිලධාරී වෙත අයදුම්පත ප්‍රමාද වී ලැබීම නිසා,
- ඡන්ද විමසීම් රාජකාරි සඳහා යොදවා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති පිරිස් අයදුම් කිරීම

## තැපැල් ඡන්ද අයදුම් කිරීමේදී මනාව දැනුම්වත් වියයුතු අංගයක් පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක්

තැපැල් ඡන්ද ආශ්‍රිතව කරුණු සාකච්ඡා කිරීමේදී ඉතා වැදගත් තේමා කිහිපයක් ඇත්තේය. එය මැතිවරණ කළමනාකරණයේ නියැළෙන තැනැත්තෙක් හට සුහුරු වදන්/හැඳින්වීම් වුවද වෙනත් අයෙකුට එකපැහැර අවබෝධය දුෂ්කර විය හැක. එබැවින් එවැනි වදන් කිහිපයක් පිළිබඳව හඳුන්වාදීමක් මෙහිදී සිදුකෙරේ.

### මැතිවරණ කොට්ඨාශ:

අංක 01 කොළඹ මැතිවරණ කොට්ඨාශයේ සිට අංක 22 කෑගල්ල මැතිවරණ කොට්ඨාශය දක්වා වූ මැතිවරණ කොට්ඨාශ 22 මෙනමින් හැඳින්වේ. එක් එක් මැතිවරණ කොට්ඨාශය පරිපාලන දිස්ත්‍රික්කයේ නමින් හැඳින්වෙන අතර වවුනියාව, මුලතිව්, මන්නාරම පරිපාලන දිස්ත්‍රික්ක තුනටම අදාළ මැතිවරණ බලප්‍රදේශය අංක 11 වන්නි මැතිවරණ කොට්ඨාශය වශයෙන්ද, යාපනය හා කිලිනොච්චිය පරිපාලන දිස්ත්‍රික්ක දෙකට අදාළ මැතිවරණ බලප්‍රදේශය යාපනය මැතිවරණ කොට්ඨාශය වශයෙන්ද හැඳින්වෙන අතර අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය අංක 13, දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාශය ලෙසද හැඳින්වේ.

### පරිපාලන දිස්ත්‍රික්ක:

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25 ක් පමණ පිහිටුවා ඇත. මෙම කුඩා දිවයින පළාත් 09 ට සමගාමීව පරිපාලනමය ලෙස බෙදා ඇති මූලිකම ව්‍යුහය මෙයයි. දැනට රටෙහි බලපවත්වන දෙවන ජනරජ ව්‍යස්ථාව තුළ මෙම පරිපාලන දිස්ත්‍රික්ක 25 හි නාම ලේඛනය අන්තර්ගතය. ඒ එහි පළමුවන උපලේඛනය මඟිනි. දැනට බලපවත්වන මෙම පරිපාලන දිස්ත්‍රික්ක සීමා වෙනස්කිරීම හෝ නව පරිපාලන දිස්ත්‍රික්ක හඳුන්වා දීම සිදුකිරීමට අවශ්‍ය වන්නේ නම් ඊට අදාළ පියවර ගත යුත්තේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවයි. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් ප්‍රධාන නිළධරයෙක් පත්කොට සිටින අතර ඔහු දිස්ත්‍රික් ලේකම්වරයා ලෙස හැඳින්වේ. රජයේ ඒජන්ත/ දිසාපති යන නම්වලින් අතීතයේ හැඳින්වූයේ ද මෙම දිස්ත්‍රික්කයේ පරිපාලන අධිකාරිය මෙහෙයවන නිළධරයා හැඳින්වීමටය.

### ඡන්ද ප්‍රදේශ:

දිවයිනේ ඡන්ද ප්‍රදේශ 160 ක් පමණ ඇත. ඒ සීමානිර්ණය කොමිෂන් සභා තීරණ යටතේ සිදුවූ බෙදීමකි. පැරණි මැතිවරණ කොට්ඨාශ ද හඳුන්වන්නේ මෙනමිනි. මැද කොළඹ, දෙවිනුවර, කල්මුණේ නිදසුන්ය.

## ඡන්ද කොට්ඨාශයඃ

යම් ඡන්ද පොළකදී ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබා ඇති ඡන්ද හිමියන් පදිංචි ප්‍රදේශය ඡන්ද කොට්ඨාශය යනුවෙන් හැඳින්වේ. එක් ඡන්ද ප්‍රදේශයක ඡන්ද කොට්ඨාශ ගණනාවක් ඇති අතර අංක 01 සිට පිළිවෙලින් අංක කර ඇත. එක් එක් ඡන්ද කොට්ඨාශය අනුව ඡන්ද හිමි නාමලේඛනය බෙදා වෙන්කළ හැකිය. දිවයිනේ ඡන්ද කොට්ඨාශ 12021 ක් ඇත.

## අනුක්‍රමික අංකය

අනුක්‍රමික අංකය ලෙස සළකනු ලබන්නේ තම නම ද ඇතුළත් අදාළ වර්ෂයේ පිළිගත් ප්‍රතිශෝධනය කරන ලද ඡන්දහිමි නාමලේඛනය තුළ ඇති අංකයයි. එය අදාළ නමට සමාන්තරව ඇති අංකයයි. එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්වන අතර අංකය වෙනස්නොවනු ලබන්නේ මැතිවරණ දෙකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා එකම ඡන්දහිමි නාමලේඛනය යොදාගන්නේ නම් පමණි.

## තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම: තාක්ෂණික හා පරිපාටිගත අභියෝග

පෙර පරිච්ඡේදයකද සඳහන් කල පරිදි තැපැල් ඡන්ද ප්‍රතික්ෂේප කිරීම වඩාත් සංවාදගතව ඇත්තේ එමඟින් අදාළ අයදුම්කරුවන්ගේ මූලික ඡන්ද අයිතිය අභියෝගයට ලක්වන නිසා නොවේ. තැපැල් ඡන්ද අයදුම්පත් ක්‍රියාවලිය සති දෙකකට නොඅඩු කාලයක් තුළ සිදුවන බැවින් අදාළ අයදුම්කරුවන් තමන් හට එම හිමිකම ලැබී තිබේද නැද්ද යන්න පිළිබඳව පූර්වයෙන් දැනුම්වත් වේ. තවද තමන් විසින් සිදුකරන ලද ප්‍රමාද දෝෂය හෝ තාක්ෂණික නොගැලපීම කවරේදැයි වටහාගැනීමට අවකාශ ලැබේ. ඒ මැතිවරණ කොමිෂන් සභාව තම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් අදාළ අයදුම්කරුවන් දැනුම්වත් කරන බැවිනි.

සාමාන්‍යයෙන් තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම යන හිසින් අදාළ මැතිවරණය හා ඊට අදාළ වර්ෂය දක්වාමැතිවරණ කාර්යාලය ප්‍රතික්ෂෙපිත අයදුම්කරුවන් වෙත යවන ලිපියක් ඇත. එමඟින් අදාළ අයදුම්පත සම්බන්ධයෙන් බලපැවැත්විය හැකි දෝෂ යටත් පිරිසෙන් 15 කට ආසන්න ප්‍රමාණයක් ලැයිස්තුගත කොට ඉන් අයදුම්කරුට අදාළ දෝෂය කවරේදැයි නිශ්චිතව දක්වයි. එහි වෙනත් ලෙස සඳහන් හේතුවක්ද දක්නට ඇත. එමඟින් අදහස් කරන්නේ ඉහත කරුණු 14 ටම අදාළ නොවන හේතුවක් පැවතීමේ සම්භාවිතාවයි. එවැනි විටෙක අදාළ වෙනත් කරුණ මැතිවරණ කාර්යාලය පැහැදිළිව දැක්වීමට බැඳී සිටී.

තවද මෙහිලා දැක්විය යුතු තවත් කරුණක් ඇත. එනම් එලෙස අයදුම්පත ප්‍රතික්ෂේප කළද මැතිවරණ කොමිෂන් සභාව සතුව යම් අභිමතයක් පවත්නේනම් අදාළ පුද්ගලයා මැතිවරණ රාජකාරි සඳහා යොදවා ගත හැකිය යන්නයි. මෙකී ක්‍රියාවලියේ පවත්නා එක් හිඩැසක් වන්නේ එලෙස ප්‍රතික්ෂේප වන අයදුම්කරුවන් සඳහා තම අයදුම්පත සංශෝධනය කොට එවීමට අවස්ථාවක් නොලැබීමයි. මෙය හුදු සීමිත කාලයක් තුළ සිදුවන සීඝ්‍ර මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයක ස්වභාවය නිසාම සිදුවන්නකි.


එවැනි අවස්ථාවක් අයදුම්කරුවන් හට ලබාදෙන්නේනම් අදාළ ප්‍රතික්ෂේපිත අයදුම්පත් ප්‍රමාණයෙන් 90% කට මඳක් වැඩි ප්‍රමාණයක් නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් සේ සැළකීමේ අවකාශ ඇත. නිදසුනක් ලෙස ප්‍රතික්ෂේපිත අයදුම්පත් වැඩි ප්‍රමාණයක් එලෙස ප්‍රතික්ෂේප කොට ඇත්තේ අනුක්‍රමික අංකය, ඡන්ද කොට්ඨාශයේ අංකය නිවැරදිව සඳහන් නොකිරීම මතය. එපමණක් නොව අයදුම්කරුගේ හෝ සහතික කරන නිළධරයාගේ  අස්සන  නොමැතිවීමද තවත් එක් දෝෂයකි. මේ සියල්ල චේතනාන්විතව සිදුවනු ඇතැයි සිතීම අපහසුය. තවද යම් කෙටි කාල සීමාවක් තුළ නැවත සකස් කොට එවීමට හැකියාව ඇති අයදුම්පත් දෝෂය ය.

එහෙත් එවැනි විකල්ප අවස්ථාවක් නොදීමේ රහස වියහැක්කේ පෙර සඳහන් කල කරුණමය. එනම් සීමිත කාලයයි. එවැන්නක් සඳහා ආමන්ත්‍රණය කල හැක්කේ තාක්ෂණික මානයක් ඔස්සේය. එබැවි වෙනත් පරිඡ්ඡෙදයක දක්වන කරුණු මඟින් විස්තර කෙරේ.

තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප වීමේදී මෙම අංකය රහිත අයදුම්පත් විශාල ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වීම සාමාන්‍යයෙන් සෑම මැතිවරණයක් පාසා සිදුවන්නකි. ඊට බලපෑ හැකි කරුණුද කිහිපයකි. එක් පසෙකින් අදාළ අංකය පිළිබඳ නොදැනීම මූලිකවම බලපායි. එය පරීක්ෂා කරගැනීම මාර්ගගතව (Online) ඉතා පහසුය. තම ජංගම දුරකථනය මඟින් මැතිවරණ කොමිෂන් සභාගත අදාළ මාර්ගගත තාක්ෂණික යෙදවුම ඔස්සේ තම ජාතික හැඳුනුම්පත් අංකය එක්කිරීම මඟින් ඉතා සීමිත කාලයක් තුළ ඊට ප්‍රවේශ විය හැක.  නොඑසේනම් අදාළ මැතිවරණ කාර්යාල හෝ කොළඹ, රාජගිරියේ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් වුව විමසා දැන ගැනීමේ හැකියාව පවතී.

එහිලා සිදුවන අනෙක් අත්වැරැද්ද වන්නේ අවසන් වරට පැවති මැතිවරණයේදී භාවිත ඡන්දහිමි නාමලේඛනය මඟින් ප්‍රදානය කරන ලද අංකයම භාවිත කිරීමයි. එය නිවැරදි එකක් බවට පත්වන්නේ පෙර මැතිවරණයේ ඡන්දහිමි නාම ලේඛනය ම ඊට පසුව පවත්වන මැතිවරණය සඳහා

ද යොදා ගතහොත් පමණි. එබැවින් බොහෝ තැපැල් ඡන්දහිමියන් සිදුකරන වරද වන්නේ තමන් සතුව දැනටමත් පවත්නා අනුක්‍රමික අංකය ලියා අයදුම්පත සම්පූර්ණ කිරීමයි.



[2]

[2] https://www.sundaytimes.lk/141221/news/almost-14-of-postal-vote-applications-rejected-128321.html

## තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම හා සබැඳි සමීක්ෂණගත තොරතුරු පිළිබඳ විග්‍රහයක්

තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම හා සබැඳිව සිදුකරන ලද සමීක්ෂණය සඳහා තෝරාගන්නා ලද පරිපාලන දිස්ත්‍රික්ක පහත පරිදිය.

- මහනුවර
- හම්බන්තොට
- යාපනය
- ගම්පහ
- බදුල්ල
- නුවරඑළිය
- කුරුණෑගල සහ
- කෑගල්ල

මෙකී දිස්ත්‍රික්ක මඟින් පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී (2020 අගෝස්තු 05 වැනිදින පවත්වන ලද) ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් 20 බැගින් මෙම සමීක්ෂණයට භාජනය කරන ලද අතර මුළු ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛ්‍යාව 160 ක් විය. එහිලා යාපනය දිස්ත්‍රික්කයෙහි අයදුම්පත් මුළුමනින්ම දෙමළ භාෂාගත ඒවා වූ අතර නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්ක දෙකෙහිද දෙමළ භාෂාගත අයදුම්පත් 04 ක් විය. ඒ එක් දිස්ත්‍රික්කයක් සඳහා දෙක බැගිනි. ඒ අනුව අයදුම්පත් 24 ක ප්‍රමාණය දෙමළ භාෂා මාධ්‍යයෙන් සම්පූර්ණ කරන ලද ඒවාය.

එහිලා මූලික වශයෙන් තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂේප කොට ඇත්තේ පහත කරුණු පිළිබඳ මූලික අවධානයක් යොමුකිරීමෙන් බව පැහැදිලි විය.

1) ඡන්ද රාජකාරි සඳහා යොදා නොගැනීම
2) තැපැල් ඡන්ද හිමිකම නොමැතිවීම
3) අයදුම්කරුගේ අස්සන තබා නොමැතිවීම
4) අයදුම්කරුගේ තනතුර සඳහන් නොකිරීම
5) සහතික කිරීමේ නිළධරයා විධිමත්ව සහතික කොට නොමැතිවීම (අස්සන /නිලමුද්‍රාව නොමැති අවස්ථා ඇතුළත්ව)
6) අයදුම්පත ප්‍රමාදවී යොමුකිරීම
7) අදාළ වර්ෂයේ භාවිත ඡන්දහිමි නාම ලේඛනයේ ලියාපදිංචිව නොසිටීම
8) ඡන්ද කොට්ඨාශයේ අංකය සහ අනුක්‍රමික අංකය ප්‍රධාන අත්‍යවශ්‍ය තොරතුරු නිසිලෙස සම්පූර්ණ නොකරන ලද අවිධිමත් අයදුම්පත් සහ
9) වෙනත්

ඉහත මූලික කරුණු 8හි අවසන් කරුණ ලෙස දක්වා ඇති වෙනත් යන්නට අදාළව සැළකිලිමත් වී ඇති කරුණු කිහිපයකි. එහිලා දක්නට ලැබුණේ සමහර අයදුම්කරුවන් තැපැල් ඡන්ද හිමිකම ලබාගැනීම සඳහා අයදුම්පත් යොමුකොට තිබුණද ඡන්ද විමසීම පැවැත්වෙන දිනය වන විට විශ්‍රාම ගොස් සිටීමයි. එසේ නොමැත්තේ නම් සමහර දෙනෙක් යටත් පිරිසෙන් විශ්‍රාම පූර්ව නිවාඩු හෝ ලබා තිබෙන බවද නිරීක්ෂණය විය

තවත් බොහෝ අවස්ථාවලදී දක්නට ලැබුණු කරුණක් වූයේ සමහර අයදුම්කරුවන් මැතිවරණයට/ඡන්ද විමසීමට අදාළ නියමිත ආකෘති පත්‍රය තෝරා නොගැනීමයි. තැපැල් ඡන්ද අයදුම් කිරීම සඳහා අයදුම්කරුවන් වෙත ලබාදී තිබූ ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමට අපහසු මාදිලියේ දුෂ්කර එකක් නොවේ. තවද එහි අයදුම්කරුට අමතරව සහතික කිරීමේ නිළධරයා සතුවද

වගකීමක් පවරා ඇත. එබැවින් යටත් පිරිසෙන් නිශ්චිතවම පුද්ගලයන් දෙදෙනෙකුගේ අධීක්ෂණයට එය ලක්වීම නිසැකය. තවද පිරවිය යුතු කරුණු ප්‍රමාණයද එතරම් විශාල නැත. ඒ අතරතුර තමන්ට නියමිත ආකෘතිය නිශ්චිතව තෝරා ගැනීමට අසමත්වීම වෙනම ම විග්‍රහකල යුතු අවස්ථාවකි. එකී කරුණද වෙනත් යන කුලකයට අයත්ය.

තවත් සමහර අවස්ථාවකදී වෙනත් කරුණක් ලෙස සළකා බලා ඇත්තේ අයදුම්කරුවන් අයදුම්පත් දෙක බැගින් යොමුකරන ලද අවස්ථාය. එකී කාර්යයේ පවත්නා වෙසෙස් ලක්ෂණයක් නම් එලෙස අයදුම්පත් දෙක බැගින් යොමුකරන ලද අවස්ථාවලදී සහතික කිරීමේ නිළධරයන් දෙදෙනෙක්ද වෙන වෙනම අස්සන් කර තිබීමයි. ඒවායේ අන්තර්ගත කරුණු සත්‍ය වුවද කුමන අයදුම්පතක් පිළිගන්නේ ද යන්න පිළිබඳව පවතින්නේ සංශයකි.

ඒ අනුව සමස්තයක් ලෙස කරුණු සමීක්ෂණයට භාජනය කොට ඇත්තේ කෙලෙසද යන්න මෙමඟින් විස්තර කෙරේ.

| දිස්ත්‍රික්කය සහ අයදුම්පත් සංඛ්‍යාව | ඡන්ද රාජකාරි සඳහා යොදා නොගැනීම | තැපැල් ඡන්ද හිමිකම නොමැතිවීම | අයදුම්කරුගේ අස්සන තබා නොමැතිවීම | අයදුම්කරුගේ තනතුර සඳහන් නොකිරීම | සහතික කිරීමේ නිළධරයා විධිමත්ව සහතික කොට නොමැතිවීම (අස්සන /නිලමුද්‍රාව නොමැති අවස්ථා ඇතුළත්ව) අයදුම්පත ප්‍රමාදවී [illegible] | අදාළ වර්ෂයේ භාවිත ඡන්දහිමි නාම ලේඛනයේ ලියාපදිංචිව නොසිටීම | ඡන්ද කොට්ඨාශයේ අංකය සහ අනුක්‍රමික අංකය ප්‍රධාන අත්‍යවශ්‍ය තොරතුරු නිසිලෙස සම්පූර්ණ නොකරන ලද අවිධිමත් අයදුම්පත් | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|
| ගම්පහ - 20 | 01 | 01 | 02 | 01 | 04 | 01 | 10 | |
| යාපනය - 20 | 01 | 01 | 02 | 01 | 02 | 05 | 08 | |
| මහනුවර - 20 | 01 | 01 | 02 | 02 | 02 | 02 | 09 | 01 |
| හම්බන්තොට - 20 | 03 | | 02 | 01 | 02 | 01 | 11 | |
| නුවරඑළිය - 20 | 03 | 01 | 03 | 03 | 04 | | 06 | |
| කෑගල්ල - 20 | | | 01 | 03 | 03 | 02 | 09 | 02 |
| කුරුණෑගල - 20 | 02 | 02 | 02 | 02 | 04 | 02 | 02 | 04 |
| බදුල්ල - 20 | 01 | 01 | 02 | 01 | | | 15 | |
| **එකතුව - 160** | **12** | **07** | **16** | **14** | **21** | **13** | **70** | **07** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව*

## එක් එක් දිස්ත්‍රික්ක අනුව සලකුණු නොකරන ලද තැපැල් ඡන්ද සංඛ්‍යාව

මෙරටේ පැවැත්වෙන සෑම මැතිවරණයකදීම පාහේ සලකුණු නොකර ඉතිරි වන තැපැල් ඡන්ද සංඛ්‍යාවක් පවතී. එය ඉහළ අගයක් ගන්නා ප්‍රතිශතයක් නොවුවද ඉලක්කගත පිරිස යම් තාක් දුරකට නිශ්චිත බැවින් එලෙස සලකුණු නොකිරීමට අදාළ හේතු විමසීමද කාලීනය. මීට අදාළව පසුගිය පාර්ලිමේන්තු මැතිවරණය හා සබැඳි දත්ත හා සංඛ්‍යා විමසිය හැකිය.

**එක් එක් දිස්ත්‍රික්ක අනුව සලකුණු නොකරන ලද තැපැල් ඡන්ද සංඛ්‍යාව**

| දිස්ත්‍රික්කය | නිකුත් කරන ලද තැපැල් ඡන්ද සංඛ්‍යාව | සලකුණු නොකළ ඉතිරි තැපැල් ඡන්ද සංඛ්‍යාව | සළකුණු කොකර ඉතුරි වූ තැපැල් ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| කොළඹ | 36,530 | 1,156 | 3.16 |
| ගම්පහ | 54,098 | 1,572 | 4.3 |
| කළුතර | 37,777 | 1,078 | 1.99 |
| මහනුවර | 54,052 | 1,402 | 3.71 |
| මාතලේ | 21,977 | 528 | 0.98 |
| නුවරඑළිය | 19,741 | 476 | 2.17 |
| ගාල්ල | 40,770 | 873 | 4.42 |
| මාතර | 29,149 | 832 | 2.04 |
| හම්බන්තොට | 20,474 | 681 | 2.34 |
| යාපනය | 21,239 | 357 | 1.74 |
| කිලිනොච්චිය | 3,590 | 53 | 0.25 |
| මන්නාරම | 4,196 | 86 | 2.4 |
| වවුනියාව | 5,132 | 103 | 2.45 |
| මුලතිව් | 3,381 | 33 | 0.64 |
| මඩකලපුව | 12,815 | 173 | 5.12 |
| අම්පාර | 28,668 | 681 | 5.31 |
| ත්‍රිකුණාමලය | 15,200 | 292 | 1.02 |
| කුරුණෑගල | 74,565 | 1,665 | 10.95 |
| පුත්තලම | 14,267 | 493 | 0.66 |
| අනුරාධපුර | 56,458 | 1,353 | 9.48 |
| පොළොන්නරුව | 19,550 | 722 | 1.28 |
| බදුල්ල | 42,872 | 1,006 | 5.15 |
| මොණරාගල | 23,411 | 691 | 1.61 |

| | | | |
|---|---|---|---|
| රත්නපුර | 31,638 | 1,024 | 4.37 |
| කෑගල්ල | 33,955 | 971 | 3.07 |
| **එකතුව** | **705,505** | **18,301** | **2.59** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව*

ඒ අනුව සමස්තයක් ලෙස මැතිවරණ කොමිෂන් සභාව මැතිවරණය සඳහා නිකුත් කරන ලද මුළු තැපැල් ඡන්ද සංඛ්‍යාව 705,505 ක් වන අතර සලකුණු නොකර ඉතිරි වූ තැපැල් ඡන්ද සංඛ්‍යාව 18,301 ක් විය. එය ප්‍රතිශතයක් ලෙස 2.59 කි.තැපැල් ඡන්ද නිකුත් කිරීමේ මධ්‍යස්ථාන 1,288 කදී පමණ ඉහත තැපැල් ඡන්ද ප්‍රමාණය නිකුත් කිරීම සිදුව ඇත. මෙලෙස තැපැල් ඡන්ද සලකුණු නොකිරීමට බලපෑ මූලිකම හේතුව වූයේ කොවිඩ් 19 ව්‍යසනය හේතුවෙන් ඡන්දදායකයන් ආරක්ෂාකාරිත්වය පිළිබඳව වැඩි උනන්දුවක් දැක්වීම විය හැකිය. සෞඛ්‍යාරක්ෂිත මැතිවරණයක් සඳහා කටයුතු සම්පාදනය කොට තිබුණේ වුවද එහිලා පුරවැසියන් වැඩි අවධානයක් යොමුකොට තිබීමත් තම අදහස පසුකාලීනව වෙනස් වීම වැනි හේතූත් මීට බලපෑවා විය හැකිය. මෙවර තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා ලබාදී තිබූ කාලය වෙනත් මැතිවරණ හා සැසඳීමේදී වඩාත් සුවිශේෂී විය. වෙනත් දිනෙක සතියක් පමණ දිවෙන සේ ලබාදෙන කාලය මෙවර දින දහයක් දක්වා දිගුකොට තිබුණි. කෙසේවෙතත් සලකුණු නොකර ඉතිරි වූ සියලු රක්ෂිත කවර තේරීම් භාර නිළධරයන්ගේ උපදෙස් මත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ඔස්සේ නැවත ලබාගෙන සුරක්ෂිතව තැන්පත් කිරීම සාමාන්‍ය සම්ප්‍රදාය වන අතර එය මෙවරද එලෙසම ක්‍රියාවට නැඟී තිබුණි.

## තැපැල් ඡන්ද ප්‍රතික්ෂේප වීමේ තාක්ෂණික සහ පරිපාටිගත කරුණු විමසීම

තැපැල් ඡන්ද ප්‍රතික්ෂේපය හා හා සමගාමීව ලොව වෙනත් රාජ්‍යයන්හි අත්දැකීම් විමසීමේදී පෙනී යන මූලික කරුණක් ඇත්තේය. එනම් සුහුරු තාක්ෂණික යෙදවුම් ආශ්‍රයෙන් සමස්ත ඡන්ද ක්‍රමය ඩිජිටල් තාක්ෂණගත ක්‍රමවේදයක් සහිත රටවල මෙවැනි තාක්ෂණික සහ පරිපටිගතමය දුබලතා දක්නට ඇත්තේ ඉතා අවම වශයෙන් බවයි. එහෙත් ඊට සමගාමීව නූතන තාක්ෂණ නැග්ම හමුවේ වෙනත් වෙසෙස් අභියෝග ප්‍රමාණයක් හමුව ඇතැයි පැවසුවහොත් එයද අසත්‍යයක් නොවේ. සැබවින්ම මැතිවරණ ක්‍රියාවලියක් යනු නව අත්හදා බැලීම් සහ ප්‍රවණතා ඔස්සේ පරෙස්සමින් සිදුකරන ප්‍රවර්තන මෙහෙයුමකි.

## තැපැල් ඡන්ද අයදුම්පත් වර්ග කිරීම

| දිස්ත්‍රික්කය | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | අනුමත අයදුම්පත් සංඛ්‍යාව | ප්‍රතික්ෂේප අයදුම්පත් සංඛ්‍යාව | ප්‍රතික්ෂේප වර්ග කිරීම | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජකාරි සඳහා යොදා නොගැනීම | තැපැල් ඡන්ද හිමිකම නොමැති | අයදුම්කරුගේ අත්සන නොමැති | විධිමත් ලෙස සහතික කර නොමැති | තොරතුරු වැරදි/අසම්පූර්ණ | ප්‍රමාද වී ලැබීම |
| කොළඹ | 38,207 | 36,530 | 1,677 | 305 | 132 | 100 | 172 | 516 | 452 |
| ගම්පහ | 55,802 | 54,098 | 1,704 | 3 | 31 | 197 | 205 | 793 | 475 |
| කලුතර | 39,807 | 37,777 | 2,030 | 673 | 97 | 111 | 367 | 522 | 260 |
| මහනුවර | 64,488 | 54,052 | 10,436 | 2,811 | 442 | 311 | 338 | 6,464 | 70 |
| මාතලේ | 23,076 | 21,977 | 1,099 | 301 | 15 | 35 | 93 | 633 | 22 |
| නුවරඑළිය | 20,979 | 19,741 | 1,238 | 123 | 67 | 30 | 83 | 929 | 6 |
| ගාල්ල | 43,610 | 40,770 | 2,840 | 410 | 149 | 124 | 247 | 1,745 | 165 |
| මාතර | 30,682 | 29,149 | 1,533 | 435 | 110 | 122 | 193 | 570 | 103 |
| හම්බන්තොට | 23,607 | 20,474 | 3,133 | 259 | 18 | 92 | 161 | 1,960 | 643 |
| යාපනය | 21,623 | 21,239 | 384 | 6 | 165 | 24 | 32 | 144 | 13 |
| මන්නාරම | 4,259 | 4,196 | 63 | - | - | - | 2 | 61 | - |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **වවුනියාව** | 5,371 | 5,132 | 239 | 37 | 40 | 18 | 6 | 71 | 67 |
| **මුලතිව්** | 3,508 | 3,381 | 127 | 11 | 2 | 2 | 22 | 90 | - |
| **කිලිනොච්චිය** | 3,650 | 3,590 | 60 | - | - | 2 | 7 | 50 | 1 |
| **මඩකලපුව** | 13,201 | 12,815 | 386 | - | 131 | 14 | 55 | 131 | 55 |
| **අම්පාර** | 30,618 | 28,668 | 1,950 | 370 | 136 | 139 | 201 | 967 | 137 |
| **ත්‍රිකුණාමලය** | 15,630 | 15,200 | 430 | 60 | 94 | 6 | 32 | 206 | 32 |
| **කුරුණෑගල** | 77,192 | 74,565 | 2,627 | 332 | 255 | 197 | 194 | 1,405 | 244 |
| **පුත්තලම** | 15,332 | 14,267 | 1,065 | 358 | 18 | 44 | 42 | 557 | 46 |
| **අනුරාධපුර** | 59,676 | 56,458 | 3,218 | 224 | 76 | 73 | 198 | 2,589 | 58 |
| **පොළොන්නරුව** | 21,965 | 19,550 | 2,415 | 230 | - | 94 | 124 | 1,846 | 121 |
| **බදුල්ල** | 46,671 | 42,872 | 3,799 | 297 | 170 | 190 | 367 | 2,701 | 74 |
| **මොණරාගල** | 26,019 | 23,411 | 2,608 | 562 | - | 111 | 81 | 1,749 | 105 |
| **රත්නපුරය** | 33,275 | 31,638 | 1,637 | 813 | 15 | 68 | 84 | 553 | 104 |
| **කෑගල්ල** | 38,346 | 33,955 | 4,391 | 536 | 2 | 222 | 140 | 3,312 | 179 |
| **මුළු එකතුව** | **756,594** | **705,505** | **51,089** | **9,156** | **2,165** | **2,326** | **3,446** | **30,564** | **3,432** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව*

ඉහත සටහන පිරික්සීමේදී ඉතා පැහැදිළි වන කරුණු කිහිපයක් ඇත්තේය. එකී නිරීක්ෂණ මෙපරිදිය.

**01.** තැපැල් ඡන්ද අයදුම්පත් වැඩිම සංඛ්‍යාවක් ප්‍රතික්ෂේප වී ඇත්තේ අනුක්‍රමික අංකය නිවැරදිව සඳහන් නොකිරීමේ හේතුව මතයි. ඊට සමගාමීව ඡන්ද කොට්ඨාශ අංකය මෙන්ම තවත් අවස්ථාවලදී වීදියේ හෝ ගමේ නමද සාවද්‍ය ලෙස ලියන අවස්ථා කිහිපයක්ම මතුව ඇත. තම අයදුම්පත හා අනෙකුත් සමගාමී තොරතුරු නිවැරදිව පරීක්ෂාව තුළ ඉතා පහසුවෙන් නිවැරදි කරගැනීමට හැකියාව පැවති දුබලතාවකි මේ. අනෙක් පසින් තමන් හට සැකසහිත තොරතුරක් වේනම් අදාළ තොරතුරු වෙත කඩිනමින් ප්‍රවේශ විය යුත්තේ කෙලෙසදැයි යන්න ද දැන සිටීම සුහුරු හැකියාවකි.එවැනි තොරතුරක් ලබාගැනීමට පහසුම මුලාශ්‍ර යුගලය වන්නේ තමන්ට සමීපතම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය හා ග්‍රාම නිලධාරීවරයාය. එහෙත් බැලු බැල්මට ඒ එකදු මුලාශ්‍රයක් වෙත හෝ සමීප නොවූ තැපැල් ඡන්දදායකයන් ප්‍රමාණය අසීමිතය.

සමස්තයක් ලෙස දිවයිනටම බලපාන සංඛ්‍යා පිළිබඳව විමසීමේදී පැහැදිළි ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛ්‍යාව වූ 51,089 ක ප්‍රමාණයෙන් 30,564 ක ප්‍රමාණයක් අපතේ ගොස්ව ඇත්තේ මෙකී දෝෂය නිසා බවයි. මිට අනුක්‍රමික අංකය/ඡන්ද කොට්ඨාශ අංකය/ගමේ වීදිය හෝ ග්‍රාම නිළධාරී කොට්ඨාශ සාවද්‍ය ලෙස සඳහන් කිරීමද ආදී කරුණු ඇතුළත් වේ. පොදුවේ තොරතුරු වැරදි ලෙස සටහන් කිරීම හෝ අසම්පූර්ණ පත්‍රිකා ලෙස මේවා සැළකීම වටී.

**02.** සහතික කිරීමේ නිළධරයා විධිමත්ව සහතික නොකිරීම: මිට අදාළ දෝෂය සහිතව අයදුම්පත් 21 ක් පමණ වාර්තා විය. ඒ මූලික සාම්පලය ලෙස ගත් අයදුම්පත් 160 ක ප්‍රමාණයෙනි. මෙලෙස විධිමත්ව සහතික නොකිරීමේදී දක්නට ලැබුණු බලවත්ම දෝෂය වූයේ සහතික කිරීමේ නිළධරයා තම අස්සන නිසි ලෙස නොතැබීමයි. තවත් බොහෝ අවස්ථාවලදී දක්නට ලැබුණේ ඔහු තම නිල මුද්‍රාව නොතබා ඇති ආකාරයයි. එසේත් නැත්නම් මේ දෝෂ දෙකම එකම අයදුම්පතේ දිස්වන ආකාරයක්ද දක්නට ලැබුණි. එය සමස්තයක් ලෙස දිවයිනටම බලපාන ප්‍රතිශතයක් ලෙස ගන්නේ නම් ප්‍රතික්ෂේපිත 51,089 ක් වූ අයදුම්පත් අතරින් 4,446 ක ප්‍රමාණයකි.

**03.** මෙහිලා දිස්වූ තවත් වෙසෙස් දෝෂයක් නම් අයදුම්කරුගේ අස්සන අයදුම්පතෙහි නොමැති වීමයි. සමස්ත 160 ක අයදුම්පත් ප්‍රමාණයෙන් 16 ක පමණ මෙම පොදු දෝෂය දිස්වූ අතර සමස්තයක් ලෙස රටෙහි ප්‍රතික්ෂේපිත අයදුම්පත් ප්‍රමාණය වූ 51,089 ක් අතරින් මෙම දෝෂය නිසා පසෙකට කරන්නට සිදුවූ නරක් වූ අයදුම්පත් ප්‍රමාණය 2,326 ක් විය.

**04.** ඊට සමගාමීව රාජකාරි සඳහා යොදා නොගැනීම මෙන්ම තැපැල් ඡන්ද හිමිකම නොමැතිවීම නිසාද සමස්තයක් ලෙස පොදුවේ පසෙකින් තැබූ ඡන්ද ප්‍රමාණය පිළිවෙලින් 9,158 ක් සහ 2,165 ක් විය. එය මැතිවරණ කොමිෂන් සභාව මඟින් තම තොරතුරු ආශ්‍රයෙන් එළඹෙන නිගමන වන අතර එහිලා වඩාත් පුදුම සහගත සිදුවීම වන්නේ අයදුම්පතේ සියළු තොරතුරු නිවැරදිව සලකුණු කොට ඇති අවස්ථාවකදී පවා තම රාජකාරි තනතුර නිවැරදිව දක්වන්නට අසමත් අයදුම්කරුවන් ද බොහෝ ප්‍රමාණයක් සිටීමයි. එය මෙම අයදුම්පත් 160 ක සාම්පලය තුළ පවා හමුවූ අතර සංඛ්‍යාත්මකව 14ක්ය. ඒ අනුව අසම්පූර්ණ යැයි පසෙකට කරන විශාලතම අයදුම්පත් පංගුව තුළ එවැනි අයදුම්පත්ද අඩු නැති බව පැහැදිළිය.

**තැපෑල ඡන්ද සලකුණු කිරීමට නොපැමිණෙන රජයේ සේවකයෝ**

තැපැල්ඡන්දදායකයන් හට තම අයදුම්පත් ප්‍රතික්ෂේප වුවද ඒ පිළිබඳ නිරන්තර පරීක්ෂාවකින් සිටීනම් අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය මඟින් එය නිවැරදි කරගැනීමේ හැකියාව පවතී. එහෙත් වඩාත් සැළකිලිමත් වියායුතු තත්වය වන්නේ අයදුම්පත් ප්‍රතික්ෂේප වීමටත් වඩා තැපැල්

ඡන්ද ප්‍රතික්ෂේප කිරීම කෙරෙහිය. මැතිවරණ කොමිෂන් සභාව වර්තමානය වන විට ඡන්ද ප්‍රතික්ෂේප කිරීම හා සබැඳිව දැඩි සාධනීය ස්ථාවරයක පසුවන්නේය. එනම් අපේක්ෂකයන් ප්‍රතික්ෂේප කල යුත්තේ ඡන්දදායකයන් මඟින් වියයුතුය යන අදහසයි.

එහෙත් ව්‍යවස්ථාපිත හා නෛතික ප්‍රතිපාදන හමුවේ එවැනි ස්ථාවරයක් ක්‍රියාවට නැඟීමට නම් ඊට අදාළ නීතිය පාර්ලිමේන්තුවේ සම්මත විය යුතුව ඇත්තේය. පොදුවේ තැපැල් ඡන්ද අයදුම්කිරීමේ ක්‍රියාවලිය නාම යෝජනා ලබාදෙන විට අවසන් කිරීම සාමාන්‍ය සම්ප්‍රදායයි. ඊට හේතු වන්නේ තැපැල් ඡන්ද සඳහා අයදුම්කරන අවස්ථාව වන විට නිල වශයෙන් කිසිදු අපේක්ෂකයෙක් පිළිබඳ දැනුමවත්වීමක් නොතිබීමේ කරුණද වියහැකිය. කෙසේවෙතත් අදාළ ක්‍රියාවලිය සඳහා ලැබෙන දින දහයක කාල සීමාව තුළ යම් නිවැරදි කිරීමක් සඳහා අයදුම්කරුට ලැබෙන අවස්ථාව සීමාසහිත බව ප්‍රත්‍යක්ෂය.

එහෙත් එයද අභිබවා පැන නැඟෙන අනෙක් කරුණ නම් යම් තැපැල් ඡන්දයක් ප්‍රතික්ෂේප වූ කල එකී තැපැල්ඡන්ද හිමියාට වෙනත් විකල්පයක් නැතිවීමයි. එනම් පසුගිය ජනාධිපතිවරණයේදී එලෙස සලකුණු නොකිරීම නිසා ප්‍රතික්ෂේප වූ තැපැල් ඡන්ද ප්‍රමාණය 18,000 ක් වූ අතර සලකුණු නොකරන ලද්දේ චේතනාන්විතව නම් එය කිසිදු අගතිදායි ප්‍රතිපලයක් ජනිත නොකරනු ඇත. එහෙත් එසේ නොවන්නේ නම් ඒසා විශාල ප්‍රමාණයක ඡන්ද අපතේ යාම දැඩිව සළකා බැලිය යුතු තත්වයකි.

## තැපැල් ඡන්දඃ ප්‍රතික්ෂේපවීම අවම කිරීමේ උපායමාර්ග සඳහා වන යෝජනා සහ අදහස්

මෙරටේ බලපැවැත්වෙන තැපැල් ඡන්ද ක්‍රියාවලිය සාමාන්‍ය පොදු ජනයා නිවැරදිව  වටහා ගෙන ඇත්තේ ද යන්න පිළිබඳව ද ඇත්තේ බලවත් සංශයකි. එය මැතිවරණ රාජකාරිය උදෙසා අදාළ කාර්යයන්හි නිරත පිරිසේ පහසුව සළසන්නක් මිස වරප්‍රසාදයක් නොවේ. ඊට අනුගත ලක්ෂ 07 කට මඳක් වැඩි මැතිවරණ කාර්යය උදෙසා තම සේවය සැළසීමට රජයේ සේවකයන් ද මෙකී පහසුකම භාරදූර කාර්යයක් සේ සැළකීම ගෝචරය.

ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය බොහෝ කලක්  ක්‍රියාවට නැඟුණු ප්‍රධානතම නෛතික ලේඛනය වූ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා අගවෙහි තැපැල් ඡන්දහිමියෙකු කවරෙක්ද හඳුන්වා තිබේ. ඉන් ඔබ්බේ අද දක්වා ඊට නව පාර්ශව එකතු කිරීමක් සිදුව ඇත. තවද ගෙවීගිය දශක 07 කට මඳක් වැඩි කාල සීමාවේ දී තැපැල් ඡන්ද අයදුම්කරුවෙකු සම්පූර්ණ කල යුතු අයදුම්පත්‍රය හා අද දවසේ පිරවිය යුතු අයදුම්පත්‍රය අතරද එතරම් විශාල වෙනසක් නැත්තේය. එනමුත් ක්‍රමයෙන් විශාල වන තැපැල් ඡන්දහිමි රජයේ සේවකයන් ප්‍රමාණයට සාපේක්ෂව ප්‍රතික්ෂේපිත ඡන්ද ප්‍රමාණය සැළකිය යුතු මට්ටමේ ප්‍රතිශතයකින් අවම වී නැති බවද නිරීක්ෂිතය.

කෙසේවෙතත් එහි යම් සුබවාදී ප්‍රවේශයක් සනිටුහන් කරන ලද්දේ පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයට සමගාමීවය. එහිදී මැතිවරණ රාජකාරියෙහි නිරත ඉදිරිපෙළ සෞඛ්‍ය සේවකයන් 14,562 ක් සඳහා තැපැල් ඡන්ද භාවිතයේ අවස්ථාව ලැබුණි. එම අවස්ථාව ව්‍යසන විරහිත කාල සීමාවකදී ද ක්‍රියාවට නංවනු ලබන්නේද යන්න පිළිබඳව ඇත්තේ අපැහැදිළිතාවකි.

අනෙක් වැදගත්ම සාධකය වන්නේ මැතිවරණ ක්‍රියාවලියට අදාළව දියත්කල යුතු දැනුම්වත්වීම් හෝ ප්‍රතිසංස්කරණ යෝජනා හුදෙකලාව එක් එක් ක්ෂේත්‍ර ඉලක්ක කරගනිමින් සිදුකිරීම එක් පසෙකින් අර්ථවිරහිත බවයි. එය සාකල්‍යමය (ගදකසිඑසපි) වෙනසක් අවැසි ක්‍රියාවලියක් ය යන්න නිරනුමානය.

## නිර්දේශ - යෝජනා සහ උපාය මාර්ග

### කෙටිකාලීන:

01. සමස්ත මැතිවරණ ක්‍රමවේදය පිළිබඳවම ප්‍රමාණවත් දැනුම්වත් කිරීමක් අවැසිය.

i. එය කිසිදු ලෙසකින් මැතිවරණ කොමිෂන් සභාවට පමණක් දැරිය හැකි වගකීමක් නොවේ. එපමණටම සංවිධාන හෝ ආයතන කිහිපයකටද උරදිය හැක්කක් නොවේ. එනමුත් නිසි සම්බන්ධීකරණයක් එක් ස්ථානයකින් සිදුවිය යුතු ක්‍රමවත් ක්‍රියාවලියකි. අවැසි සම්බන්ධීකරණය මැතිවරණ නිරීක්ෂණ සංවිධානයකට දැරිය හැකිය. මැතිවරණ කොමිෂන් සභාව එහි පූර්ණ තාක්ෂණික හවුල්කරු විය යුතුය.

ii. ඡන්දහිමි නාමලේඛනය ඔස්සේ ලියාපදිංචි වීම හා තම ඡන්ද කොට්ඨාශය මෙන්ම තමන්ගේ අනුක්‍රමික අංකය කුමක්දැයි යන්න ඡන්දහිමියන් අවබෝධකරගෙන සිටීම වැදගත්ය යන්න අවධාරණය කල යුතුය. (මැතිවරණ කොට්ඨාශය ,ඡන්ද ප්‍රදේශය, ආදී ලෙසින් වන හැඳින්වීම් පිළිබඳව පුරවැසි ප්‍රජාව කිසිදු ලෙසකින් දැනුම්වත් නැත)

iii. එක් තැපැල් ඡන්දයක් බලාත්මක කිරීම සඳහා දරන්නට වන පිරිවැය ද ඇතුළත්ව එහි වැදගත්කම මෙන්ම ක්‍රියාවලිය පිළිබඳව පියවරෙන් පියවර පැහැදිලි කරන ඇනිමේෂන් සහිත වීඩියෝ පට මෙන්ම පත්‍රිකා ආදිය නිෂ්පාදනය අත්‍යවශ්‍යය. එහිලා සහතික කිරීමේ නිළධරයා සතු වගකීමද පැහැදිළි කළ හැකිය.

iv. ඡන්දහිමි නාමලේඛන ප්‍රදර්ශනය සියළු දිස්ත්‍රික් ලේකම් කාර්යාල (කච්චේරි) මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල (ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත්වන ඡන්ද ප්‍රදේශයේ නාම ලේඛන පමණි) ඇතුළු තවත් ස්ථාන බොහෝවල සිදුවේ. එබැවින් අදාළ ස්ථාන වෙත ප්‍රවේශව තමන්ගේ නම එහි ඇතිදැයි පරීක්ෂා කරගැනීම සඳහා තැපැල් ඡන්දදායකයන් හැකිතාක් පෙළඹවිය යුතුය.

v. අඛණ්ඩව තම වගකීම් පැහැර හරිමින් වගකීම් විරහිතව තැපැල් ඡන්ද පත්‍රිකා සහතික කරන සහතික කිරීමේ නිළධරයන් මෙන්ම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් සචේතනිකව හෝ අචේතනිකව වේවා (එලෙස හඳුනාගැනීමට නොහැකි බැවින්) එකී සියළු දෙනා නිවැරදිව හඳුනා ගත හැකි බැවින් ඒ සැම දෙනෙකුගේම පෞද්ගලික ලිපිගොණුවට අදාළ දෝෂය වාර්තා වන සේ වාර්තාවක් අඩංගු කිරීමට පියවර ගත යුතුය. ඉල්ලුම්පත්‍රය පසෙකට කරන්නට සිදුවුයේ කවර කරුණක් නිසාද යන්න තේරීමේ භාර/සහකාර තේරීම්භාර නිළධරයන් දැනුම්දෙන බැවින් ඊට සමගාමීව ආයතනික පරීක්ෂණයක් කොට වාර්තාවක් එවන ලෙස මැතිවරණ කොමිෂන් සභාව මඟින් දැන්වීම කාලෝචිතය.

vi. මැතිවරණ රාජකාරි සඳහා බඳවා ගන්නේද නැතිද යන්න පිළිබඳව ගන්නා තීරණය හා ඊට සමගාමීව තැපැල් ඡන්ද අපේක්ෂිත තැනැත්තන් දක්වන ප්‍රතිචාර දැනගැනීමේ සමස්ත ක්‍රමවේදය වඩාත් කඩිනම් කලහැකිදැයි විමසීම වටී.

vii. තැපැල් ඡන්ද භාවිතය සඳහා සඳහා තම අභිලාශය දක්වා පසුව ඊට සහභාගී නොවන්නේ නම් ඒ කවර හේතු නිසාදැයි යන්න ආයතනිකව විමසා අදාළ වාර්තාවක් මැතිවරණ කොමිෂන් සභාවට යැවිය හැකිය. අනතුරුව එහිලා කොමිසම දක්වන ප්‍රතිචාරය ද අදාළ සේවකයාගේ පෞද්ගලික ලිපිගොනුවට එක් කල යුතුය. රාජ්‍ය සේවයේ වගකීම් සහ කාර්යභාරය විමසන අවස්ථාවන්හිදී ඡන්ද භාවිතය මෙන්ම තැපැල් ඡන්ද අයදුම්කරන්නේ නම් එහි ක්‍රියාකාරිත්වයෙහි ඇති වැදගත්කමද හැකි හැමවිටම අවධාරණය වියයුත්තේය.

## දිගුකාලීනඃ

සමස්ත ඡන්දහිමි නාම ලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලියම මුළුමනින්ම පරිගණකගත කොට ඊට අදාළ යාවත්කාලීන කාර්යය ද ස්වයංක්‍රියව ක්‍රියාකරන මට්ටමක් කරා ගෙන ඒමට පියවර ගතයුතුව ඇත. එවැනි ක්‍රියාමාර්ගයකදී අස්සන් නොයෙදීම/නිලමුද්‍රා භාවිතය මෙන්ම ඡන්ද රාජකාරි සඳහා කැඳවන්නේ නැතිද ආදී වශයෙන් වන කරුණු පිළිබඳව නිශ්චිත හා ක්ෂණික අවබෝධයක් ලද හැකිය. සමස්ත ක්‍රමවේදයම දිජිටල්කරණයට බඳුන් කිරීමට පළමු අවැසිනම් එය යම් දිස්ත්‍රික්කයක් පාදක නියාමන ව්‍යාපෘතියක් බවට පත්කළ හැකිය.

## උපයෝගී කරගන්නා ලද ග්‍රන්ථ/ලිපිලේඛන


- ✓ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- ✓ 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත
- ✓ 1981 අංක 15 දරන ජනාධිපතිවරණ පනත
- ✓ ඡන්ද විමසීම්වලදී තැපෑලෙන් ඡන්දය දීමේ ක්‍රියාපිළිවෙල පිළිබඳ ආයතන ප්‍රධානීන්ට සහ සහතික කිරීමේ නිළධාරින්ට මඟ පෙන්වීමේ උපදෙස් (මැතිවරණ කොමිෂන් සභාව මඟින් ප්‍රකාශිත)
- ✓ 2020 අගෝස්තු මස 05 වන දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාවේ වාර්තාව
- ✓ 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත